# 18 ගොනා වගේ සිටි අන්දරේ...

අන්දරේ මාතර දික්වැල්ල ගමේ උපන් කෙනෙකි. ඔහු කුඩා අවදියේ සිට ම කවටයකු ලෙස ප්‍රසිද්ධ විය. ළමා කාලයේ දී ඔහු කළ කවටකමක් මෙහි දැක්වේ.

පුංචි අන්දරේගේ සොහොයුරියකගේ විවාහ උත්සවය ළඟා විය. එම උත්සවයට බොහෝ නෑදෑයන්ටත් හිතවතුන්ටත් ආරාධනා ලැබී තිබුණි. මගුල් ගෙදර කටයුතු හොඳින් සුදානම් කර තිබුණි. අන්දරේ සිනාසෙමින් එහා මෙහා ඇවිදිමින් සිටියේ ය. අන්දරේගේ කවටකම් ගැන දන්නා අම්මා ඔහු කැඳවා අවවාද කිරීමට සිතුවා ය. අන්දරේ මිදුලට වී දඟකරමින් සිටිනු දැක අම්මා ඔහුට කතා කළා ය. රසකැවිලි දීමට කතා කරනවා ඇතැයි සිතූ අන්දරේ අම්මා ළඟට පැමිණියේ ය. අම්මා අන්දරේ ළඟට කරගෙන මෙසේ කීවා ය.



අන්දරේ මේ බලපන්
ගොනා වගේ හිටපන්
දෙන දේ කාපන්
නිකම් ම හිටපන්

එවිට අන්දරේ සිනා සී මෙසේ කීවේ ය.

හොඳයි මගේ අම්මා
ගොනා වගේ ඉන්නම්
දෙන දේ කන්නම්
නිකම් ම ඉන්නම්

පුතා කවියෙන් ම පිළිතුරු දීම ගැන අම්මා බොහෝ සතුටට පත් වූවා ය.

බොහෝ නෑදෑයෝත් යහළුවෝත් ජයට සැරසී මඟුල් ගෙදරට පැමිණියෝ ය. මිහිරි ආහාරපානවලින් සංග්‍රහ ලැබුවෝ ය. ඉන්පසු සතුටු සාමීචි කතාවේ යෙදී සිටියෝ ය. අන්දරේ පසෙකට වී කල්පනා කරමින් සිටියේ ය. එවිට අම්මා දුන් අවවාද ඔහුට සිහි විය.

එක්වර ම අන්දරේ අත්දෙක උස්සා බිම තැබුවේ ය. හිස සොලවමින් ගොනකු මෙන් ශබ්ද කර ළඟ සිටි නෑදෑයෙකුට හිසෙන් ඇන්නේ ය. ඉන්පසු අනෙක් අයට ද අනින්නට පටන් ගත්තේ ය.



මඟුල් ගෙදර සිටි හැමදෙනා ම කලබල වී එහා මෙහා දුවන්නට පටන් ගත්හ. පුටු මේස එහාට මෙහාට පෙරළී ගියේ ය. කෑම බීම හැමතැන ම සීසීකඩව විසිරුණේ ය. මල් බඳුන් කැඩීබිඳී ගියේ ය. ගැහැනු අය පැලඳ සිටි මාල කැඩී පබළු ඇට තරගයට මෙන් බිම දිගේ විසිරී ගියේ ය. මනාල ජෝඩුව පෙරළුණු මේසයකට හිර වී පුදුමයෙන් බලා සිටියෝ ය. මඟුල් ගෙදර සතුටු සිනා නැවතී විලාප හඬ මතු විය.

මේ කලබලය ඇසී අන්දරේගේ අම්මා දුවගෙන ආවා ය. ඇය එහාට මෙහාට පැන පෙරළි කරන අන්දරේ අල්ලා ගත්තා ය.

"මොකද්ද උඹ මේ කළේ?" අන්දරේගේ අතින් අල්ලාගෙන අම්මා කේන්තියෙන් ඇසුවා ය.

"ඇයි අම්මා කිව්වා නේ ද අද මට ගොනකු වගේ ඉන්න කියලා. ඒකයි මං එහෙම කළේ " අන්දරේ කිසිවක් නොදන්නකු මෙන් කීවේ ය. අම්මාට කාරණය වැටහුණි. ඇය තරහයෙන් පිපිරී අන්දරේ ඇදගෙන ගොස් පාළු කාමරයකට දැම්මා ය.

## ක්‍රියාකාරකම : 1

පාඩම අවබෝධයෙන් යුතු ව කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. විවාහ උත්සවය සූදානම් කළේ කෙසේ ද?

ii. අම්මා අන්දරේගේ අතින් අල්ලා කීවේ කුමක් ද?

iii. මඟුල් ගෙදර කලබලයට පත් වූයේ කුමක් නිසා ද?

iv. අම්මා අන්දරේට දඬුවම් කළේ ඇයි?

## ක්‍රියාකාරකම : 2

පහත සඳහන් වාක්‍යවල කළු කර ඇති පද විමසා බලන්න.

අන්දරේ අත්දෙක **උස්සලා** බිම තැබුවා.
අන්දරේ අත්දෙක **උස්සා** බිම තැබුවේ ය.

ළමයා ගෙට **වැදිලා** අඬනවා.
ළමයා ගෙට **වැදී** අඬයි.

නංගි පොත් පාඩම් **කරලා** නින්දට ගියා.
නංගී පොත් පාඩම් **කර** නින්දට ගියා ය.

ගොවියෝ ගොයම් මිටි **බැඳලා** නාන්නට යනවා.
ගොවියෝ ගොයම් මිටි **බැඳ** නාන්නට යති.

අම්මා පොල් අතු **ඇදලා** ගෙදර එනවා.
අම්මා පොල් අතු **ඇද** ගෙදර එයි.

කිරිල්ලිය අහර **ගෙනල්ලා** පැටවුන්ට කවනවා.
කිරිල්ලිය අහර **ගෙනවුත්** පැටවුන්ට කවයි.

ගුරුතුමා/ගුරුතුමීගේ උපදෙස් ගෙන පහත සඳහන් කොටස ඔබේ වචනයෙන් කියන්න.

මගුල් ගෙදර සිටි හැමදෙනා ම කලබල වී එහා මෙහා දුවන්ට පටන් ගත්හ. පුටු, මේස එහා මෙහා පෙරළී ගියේ ය. කෑම බීම හැමතැන ම සීසීකඩ විසිරුණේ ය. මල්බඳුන් කැඩී බිඳී ගියේ ය. ගැහැනු අය පැළඳ සිටි මාල කැඩී පබළු ඇට තරගයට බිම දිගේ විසිරී ගියේ ය. මනාල ජෝඩුව පෙරළුණු මේසයකට හිර වී පුදුමයෙන් බලා සිටියෝ ය.

## ක්‍රියාකාරකම : 3

මෙම කොටසේ ඇති හිස්තැනට ගැළපෙන වචන දී ඇති වචනවලින් තෝරා ලියන්න.

ගම මහගේ මිදුලට ________________ අඬ අඬා සිටියා ය. අමුත්තෙක් ________________ "ඇයි හාමිනේ අඬන්නේ" යැයි ඇසී ය. "මගේ දූ කළුහාමී එලොව ________________ ටිකක් කල්. "එලොව ගිහින් ________________ තමයි මමත් මේ ආවේ. මමයි එයාගෙ සැමියා," අමුත්තා කීවේ ය. ගම මහගේ එය ________________ බෑනා ගෙට ________________ කෑම බීම හොඳට ________________ දුවට දෙන්න කියා රන් රිදී පොට්ටනියකුත් දුන්නා ය.

ගෙදර පැමිණි ගමරාල මෙය ________________ අශ්වයා පිටේ ________________ සොරා පසුපස ලුහුබැන්දේ ය. ගමරාල එන බව ________________ සොරා ගහකට නැංගේ ය. ගමරාල ද අශ්වයා ගඟ ළඟ ________________ ගහට නැංගේය. සොරා බිමට ________________ අශ්වයා පිටේ නැගී ගියේ ය. ගමරාල ඒ බව ________________ "බෑනෝ, රන්රිදී අම්මාගෙන් අශ්වයා මගෙන්" යයි කීවේ ය.

**වචන ලැයිස්තුව**

(ගිහිල්ලා, වී, දුටු, දී, කැඳවා, පැමිණ, තබා, නැගී, අසා, දැනගෙන, දැක, බැස, ඉඳලා)


## ක්‍රියාකාරකම : 4

ගුරුතුමා/ගුරුතුමීගේ මග පෙන්වීම යටතේ පහත දැක්වෙන පින්තූර ඇසුරෙන් කතාවක් ලියන්න.


i.



ii.



iii.




iv.



v.



vi.



## ක්‍රියාකාරකම : 5

මෙම පද යොදා කුඩා වැකි සාදන්න.

i. කැඳවා - ගුරුතුමා මා **කැඳවා** පොතක් දුන්නේ ය.
ii. දැක
iii. ගොස්
iv. බලා
v. ගෙනවුත්

## ක්‍රියාකාරකම් : 6

දී ඇති වචන යොදා මෙම වාක්‍යවල හිස්තැන් පුරවන්න.

i. වෙළෙන්දෝ නගරයට ______________ බඩු විකුණති.
ii. ළමයි උදෙන් ම ______________ පාඩම් කරති.
iii. මිනිසා ඔරුවේ ______________ එගොඩට යයි.
iv. අක්කා රෙදි ______________ අව්වේ වැනුවා ය.
v. ගොවියා කුඹුරු ______________ වී වපුරයි.
vi. නෑදෑයෝ මගුල් ගෙදරට ______________ අසුන් ගත්හ.
vii. මොනරා පිල් ______________ නටයි.
viii. මව ළදරුවාගේ හිස ______________ ආදරය දක්වයි.
ix. තාත්තා ගවයා ______________ ගෙදර ආවේ ය.
x. අපි දෙමාපියන්ට ______________ පාසල් ගියෙමු.

| | | | |
|---|---|---|---|
| නැගිට | නැගී | විදහා | වැඳ |
| සෝද | කොටා | සිඹ | |
| ගොස් | පැමිණ | බැඳ | |